# <u>වයඹ පළාත් සභාව - 2019</u>

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

වයඹ පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 21 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 27 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, වයඹ පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------------------

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2007 සිට 2010 වර්ෂය දක්වා කාලසීමාව තුලදී ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදු වී තිබුණු මූල්‍ය අක්‍රමිකතාවයට අදාලව අයකර ගැනීම අවිනිශ්චිතව ඇති රු.13,609,655 ක මුදල සඳහා කිසිදු හානිකරණ (impairment) ගැලපීමකින් තොරව මුදල් හා මුදලට සමාන දෑ තුළ පළාත් භාණ්ඩාගාර තැන්පතු (හානි) වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ගෙන් රු.13,603,655 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2018.05.22 දින අංක 18/විවිධ(019) දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය ආයතන දෙකක් අතර ඇතිවන ආරවුල්වලදී නීතිමය ක්‍රියාමාර්ග නොගෙන සාකච්ඡා සම්මුති ක්‍රමවේද මඟින් නිරාකරණය කරගත යුතු බව තීරණය වී ඇත. ඉහත කරුණ නිසා මේ සම්බන්ධව ඉදිරි නෛතික ක්‍රියාමාර්ග ගත නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. තවද මහජන බැංකුවට එරෙහිව වන්දි නඩුවක් පවරන ලෙසත් සාක්ෂි දීම සඳහා අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපත් වන බවත් පවසා ඇත. |
| (ආ) | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ආයෝජනයක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස සුදුසුකම් ලැබීම සඳහා එය අත්පත් කරගත් දිනයේ සිට මාස 03 ක් හෝ ඊට අඩුකාලයක් වැනි කෙටි කල්පිරීමේ කාලයක් පවතින ආයෝජන පමණක් වුවත් අවුරුදු 01 ක කාලසීමාවක් සඳහා ආයෝජනය කර තිබුණු රු.1,251,338,792 ක් වටිනා ස්ථාවර තැන්පතු හා මාස 06 ක කාලයක් සඳහා ආයෝජනය කර තිබුණු රු.825,270,111 ක් වටිනා භාණ්ඩාගාර තැන්පතු වශයෙන් මුළු වටිනාකම රු.2,076,608,903 ක් | මාස 03 කට වැඩි කාලයක් සඳහා සිදු කරනු ලබන ආයෝජනයන් ජංගම වත්කම් යටතේ වෙනමම ගිණුම්ගත කළ යුතුය. | අතිරික්ත මුදල් සහ අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු වල වත්කම් සඳහා වන ක්ෂය සංචිත අරමුදල්, කෙටිකාලීන වගකීම් පියවා ගැනීමට හැකිවන පරිදි භාණ්ඩාගාර බිල්පත් වල සහ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇති අතර, කල් පිරීමේදී ලැබෙන පොලිය නැවත ආයෝජනය වන පරිදි විධිවිධාන සලසා ඇත. මෙම ආයෝජන අවශ්‍ය ඕනෑම අවස්ථාවක මුදල් කර ගැනීමට අපේක්ෂා කරන හෙයින් කෙටිකාලීන ආයෝජන ලෙස ජංගම වත්කම් යටතේ වර්ග කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ, මුදල් හා මුදල් සමාන දෑ යටතේ ගිණුම්ගත කර තිබුණු අතර ඊට අනුරූපිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ද එම මුදල මුදල් හා මුදල් සමාන දෑ වල දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ එම වටිනාකමින් වැඩි වී තිබුණි. | | |
| (ඇ) | මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වැය කර තිබුණු රු.1,933,532,550 ක් කිසිදු විග්‍රහයකින් තොරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පළාත් ආයෝජන වියදමක් ලෙස කපා හැර තිබුණි. | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා කරනු ලබන වියදම් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. | අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති අනුව මූලධන වත්කම් අත්පත් කරගැනීම් පමණක් ජංගම නොවන වත්කම් ලෙස වර්ග කරන ලද අතර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ වන වියදම් වත්කම් වත්කම් වල අගය පවත්වාගෙන යාම සඳහා දරන ලද වියදම් සේ සලකා ඇත. එම වියදම් ද ඇතුළු අනෙකුත් සියලු මූලධන වියදම් පළාත් ආයෝජන වියදම් ලෙසට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුලත් කොට ගිණුම් ගත කොට ඇත. |
| (ඇ) | පළාත් සභාවේ 2019 ජනවාරි 01 දිනට පැවති රු.227,076,112 ක වටිනාකමකින් යුත් හඳුනා නොගත් වත්කම් සමාලෝචිත වර්ෂය තුළ දී පසුගිය වර්ෂවලට අදාලව ගැලපුම් කර කපා හැර තිබුණු නමුත් ඊට අදාල සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදි. | හඳුනා නොගත් වත්කම් වටිනාකම, විධිමත්ව හඳුනාගැනීමට කටයුතු කළ යුතු අතර කපා හැරීමට අදාල විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. | වත්කම් ලේඛන අනුව වන ශේෂයන් ආරම්භක ශේෂයන් ලෙස ගෙන අත්පත් කර ගැනීම් හා ඉවත්කිරීම් ගලපා අවසන් ශේෂ ගණනය කොට පළාත් භාණ්ඩාගාර ශේෂයන්ට 2018 වර්ෂයෙන් ඉදිරියට ගෙනා රු. 618,133,006 ක ශේෂයක් ගලපන ලද අතර එම ශේෂය තුළ කපා හරින ලද රු.227,076,112 ක ශේෂයද ඇතුලත්ය. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **මහා නගර සභා ආඥා පනත** | | | |
| 317 වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කුරුණෑගල මහා නගර සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමීක්ෂණ සිදුකර ඒ පිළිබඳ වාර්තා නගරාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර වාර්ෂිකව වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙතෙක් එවන් සමීක්ෂණයක් සිදුකර නොමැති අතර ඉදිරියේදී එය සිදු කිරීම සඳහා මේ වන විට වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| 571 | සමාලෝචිත වර්ෂයේ අවසානයට වයඹ පළාත් සභාවට අයත් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තු 9 ක් ඇතුළු ආයතන 10 ක වර්ෂ 2 ඉක්ම වූ රු.132,653,269 ක් වටිනා පොදු තැන්පතු නිරවුල් කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳ මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | (i) ව්‍යාපෘතිවල කටයුතු අවසන් කර නොමැති බැවින් අවසන් තීරණ ලැබෙන තෙක් රඳවාගෙන ඇත.<br><br>(ii) පොදු තැන්පත් ගිණුමේ ඇති කල් ඉකුත් වූ ශේෂ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කරගෙන ඇති අතර දැනටමත් එම ශේෂ නිරවුල් වෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

(ඇ) **භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| මුදල් අමාත්‍යාංශයේ 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයෙහි (v) ඡේදය | දේශීය අරමුදල් භාවිතා කරමින් සංවිධානය කරන විදේශ අධ්‍යයන චාරිකා ගමන් අත්හිටුවා තිබු නමුත්, ප්‍රධාන අමාත්‍යාංශයේ නිලධාරීන් 6 දෙනෙකුට විදේශ ගතවීම වෙනුවෙන් රු.1,367,267 ක මුදලක් වැය කර තිබුණි. | විටින් විට රජය විසින් රාජ්‍ය මුදල් පාලනය කිරීම සඳහා නිකුත් කරනු ලබන චක්‍රලේඛ සම්බන්ධයෙන් පළාත් සභා ආයතන ප්‍රධානීන්ගේද විශේෂ අවධානය යොමු විය යුතුය. | මුදල් අමාත්‍යාංශයේ 2019.06.17 දිනැති අයවැය චක්‍රලේඛ අංක 04/2019 (V) මඟින් දේශීය අරමුදල් භාවිතා කරමින් සංවිධානය කරන විදේශ අධ්‍යයන චාරිකා අත්හිටුවීමට කටයුතු කළ යුතු බව සඳහන් කර ඇත. එහෙත් විගණන වාර්තාවේ සඳහන් කර ඇති නිලධාරීන් විදේශ ගත වූයේ චීන රජයෙන් සංවිධානය කරන ලද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් කරන ලද තෝරා ගැනීම් අනුව බව සඳහන් කරමි. අනෙකුත් නිලධාරීන් ශ්‍රී ලංකා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් කරන ලද තෝරාගැනීම් අනුව විදේශ ගත වු බැවින් සංචාරයට අදාල දීමනා ගෙවීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම පිළිබඳ 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛය | විශ්‍රාමිකයෙකු නැවත සේවයේ යොදවනු ලබන කාල සීමාව තුළ දී ආයතන ප්‍රධානියා සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනා ගනු ලැබිය යුතු වුවද පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන ආයතන 09 ක තනතුරු 04 ක් සඳහා විශ්‍රාමික රජයේ | ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා මානව සම්පත නිසි පරිදි කළමනාකරණය කරගැනීම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු අතර | පළාත් පාලන ආයතනවල මෙහෙයුම් හා සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය ලේකම්, කාර්මික නිලධාරි, ආදායම් පරීක්ෂක හා නිර්මාණ වැඩ අධිකාරි යන තනතුරුවල පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පවතින බවද, මේ |

| | | | | |
|---|---|---|---|---|
| | | නිලධාරීන් 13 ක් කොන්ත්‍රාත් පදනම මත වසරකට වැඩි කාලයක් සේවයේ යොදවාගෙන තිබුණි.<br>විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ යොදවන විට ඔහු අවසන් වරට ලැබූ මාසික වැටුපට සමාන දීමනාවක් ගෙවිය හැකි නමුත් විශ්‍රාමික පළාත් ආදායම් කොමසාරිස්වරයාට අවුරුදු 01 මාස 07 දින 15 කට ආසන්න කාලයක් නැවත සේවයේ යෙදවීමේදී ගෙවිය යුතු රු.77,627 ක මාසික දිමනාව වෙනුවට මාසිකව රු.160,684 ක් බැගින් ගෙවීම හේතුවෙන් චක්‍රලේඛ විධිවිධාන අභිබවමින් කරන ලද වැඩිපුර ගෙවීම් රු.1,619,610 ක් විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරන්තරව දැනුවත් කිරීම සිදු කරන බවද පුරප්පාඩු සම්පූර්ණ වනතුරු අනිවාර්යය කළ යුතු සේවාවන්වන ආයතනික කටයුතු, සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු හා ආදායම් රැස් කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සිදු වූ බව සඳහන් කරමි. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හි 02 (1) | සභා ලේකම් කාර්යාලයේ 10 දෙනෙකුගෙන් සමන්විත සභාපති කාර්ය මණ්ඩලයේ සහ ආණ්ඩුකාර පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම හා සේවයේ නිරත වීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.9,229,162 ක් ගෙවා තිබුණි. | පළාත් සභාවෙන් වැටුප් ලබන සියලු කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම අදාල චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල විය යුතු වේ. | ගරු ආණ්ඩුකාරතුමාගේ දැනුම් දීම අනුව ඔවුන් සඳහා පැමිණීමේ ලේඛනය පමණක් භාවිත කර, ඇඟිලි සලකුණු යන්ත්‍රය ඉවත් කරන ලදී. එහි වගකීම කාර්යාලයේ අධීක්ෂණයෙන් බාහිරව ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු වී ඇති බවත් සඳහන් කරමි. |

(ඉ) **වෙනත් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 12 දිනැති පී.එස්/සීඑස්ඒ/11 -18 දරන ජනාධිපති චක්‍රලේඛය | ආණ්ඩුකාරවර රියදුරන්ට පමණක් මසකට පැය 200 ක අතිකාල දීමනා අනුමත කර තිබුණද, ඊට අනුකූල නොවන පරිදි හා විධිමත් අනුමැතියකින් තොරව ආණ්ඩුකාර පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකුට 2019 වර්ෂයේ පෙබරවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මසකට පැය 200 බැගින් රු.2,025,120 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. | අතිකාල දීමනා ගෙවීම අදාල චක්‍රලේඛවලට අනුකූල විය යුතු වේ. | පළාත් සභා විසුරුවා හැරීමෙන් පසු අමාත්‍යාංශවල රාජකාරී ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරීමත් සමඟ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ද, අමතර කාර්යයන් සඳහා නිරත වීමට සිදුවීම හේතුවෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් එම නිලධාරීන් සඳහා පැය 200 ක අතිකාල දීමනාවක් ගෙවන ලෙස නියම කරන ලදී. පෞද්ගලික ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතියෙන් පසු ගෙවීම් සිදුකර ඇත. |

## 2. ආදායම් කළමනාකරණය

## 2.1 ප්‍රධාන ලේකම් රැස්කරන ලද ආදායම් (මුද්දර ගාස්තු/ උසාවි දඩ) පළාත් පාලන ආයතනවලට බෙදා හැරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන වෙනුවෙන් එකතු කරනු ලබන, මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් අදාල පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා ප්‍රජා සේවාවන් ඉටු කිරීම සඳහා එම ආයතන වෙත ලබා දීමට කටයුතු කළ යුතු වුවත් වයඹ පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුද්දර ගාස්තු සහ | පළාත් පාලන ආයතන වෙත උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙවීම් කඩිනම් කළ යුතුය. | දැනට පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු මුදල් සහ උසාවි දඩ මුදල් ආදායම් ගෙවීම් කටයුතු සිදුකරනු ලබන්නේ, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුවය. 2019.12.31 දිනට අප වෙත පළාත් පාලන ආයතන විසින් ඉදිරිපත් කරන ලද සියළුම මුදල් ඉල්ලීම් ලිපි වෙනුවෙන් ගෙවීම් කර අවසන් කරන ලදී. කෙසේ වෙතත් |

| | | | |
|---|---|---|---|
| | උසාවි දඩ ලෙස එකතුකර ගත් පිළිවෙලින් රු.313,031,038 ක් සහ රු.111,187,945 ක් අදාල පළාත් පාලන ආයතන වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි. | | දැනටමත් එම ගෙවීමට ඉතිරිව තිබූ මුදල් බොහොමයක් ඊට අදාල පළාත් පාලන ආයතන වෙත ගෙවා අවසන් කර ඇත. |

## 2.2 හිඟ ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2019 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 08 ක් සඳහා අයකරගත යුතු රු.232,866,539 ක් වූ ආදායම හිඟව පැවතුණි. මින් රු.152,872,009 ක් වසර 3 කට වඩා ඉපැරණි ශේෂයන් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 1991 සිට 2010 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල ලිපිගොනු 784 කින් හිඟ හිටි රු.116,981,289 ක් වූ පිරිවැටුම් බදු, 2011 වර්ෂය සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු ගොනු 483 කින් හිඟ හිටි බදු මුදල් හා දඩ මුදල් පිළිවෙලින් රු.36,894,328 ක් හා රු.40,051,262 ක් සහ 2016 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල හිඟ හිටි අතිරේක මුද්දර ගාස්තු රු.76,945,590 ක් අයකිරීම අත්හැර දැමීම හේතුවෙන් පළාත් සභා අරමුදලට අහිමි වී ඇති ආදායම රු.193,926,879 ක් විය. | හිඟ පිරිවැටුම් බදු අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟ බදු අයකර ගැනීම සඳහා, විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පසු ගෙවීම් පැහැරහරින්නන් සිටින්නේ නම්, අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන ලදී. එසේ කටයුතු කිරීමේ දී ව්‍යාපාර වසා තිබීම නිසා හා බදු ගෙවන්නන් සොයා ගැනීමට අපහසු විට එම බදු නිදහස් කිරීම සඳහා කටයුතු කරන ලදී. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,026,749,479 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 274,433,543 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ ඌනතාවය රු.752,315,936 කින් හෙවත් සියයට 274 කින් වර්ධනය වී තිබුණි.

**4** **ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්**

**------------------------------------------------------------------------------------------**

**4.1** **ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්**

**-------------------------------**

**(අ)** **වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

**-------------------------------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | කුරුණෑගල මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් 2018 අගෝස්තු 10 දින රු.880,000 කින් ආරම්භකර, 2019 නොවැම්බර් 30 දින වන විට රු.3,132,160 ක මුදල් ශේෂයකින් සමන්විත විය. මෙම ගිණුමේ මෙහෙයුම් කටයුතු සිදුව නොමැති බැවින් නිශ්කාර්ය ලෙස ජංගම ගිණුමක රඳවා තිබු එම මුදල, අධිකාරියේ අරමුදල් ශක්තිය වැඩිකර ගැනීම සඳහා හෝ සුදුසු ආයෝජනයක යෙදවීමට කළමනාකාරිත්වයේ අවධානය යොමුකර නොතිබුණි. | අතිරික්ත මුදල් සුදුසු පරිදි ආයෝජනයක යෙදවිය යුතුවේ. | අරමුදල් තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා වාර්ෂිකව එකතුවන මුදල් ගිණුමේ රඳවාගෙන ඉතිරි මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට අපේක්ෂා කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2011 සැප්තැම්බර් 29 දින සිට 2019 නොවැම්බර් 30 දින දක්වා අධිකාරියට ලැබී තිබූ රු.22,300,000ක අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු සහතික 15 ක ආයෝජනය කර තිබූ අතර ඉන් තැන්පතු සහතික 10 ක එකතු වටිනාකම් වූ රු.13,900,000 ක් සමාලෝචිත වර්ෂය තුළ කල්පිරීමෙන් ලැබුණු රු.1,350,905 ක් වූ පොලී ආදායම අධිකාරියේ පොදු ජංගම ගිණුමට මාරු කර තිබුණද එහි ආර්ථිකභාවයක් විගණනයේ දී නිරීක්ෂණය නොවිණි. | ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකාරීත්වය කටයුතු කළ යුතුයි. | අධිකාරියේ වියදම් ආවරණය කර ගැනිමේ අරමුණින් ස්ථාවර තැන්පත් කල් පිරීමේදී ලැබෙන පොලී ආදායම අධිකාරියේ පොදු ජංගම ගිණුමට මාරු කිරීමට කටයුතු කරන ලදී. |
| (iii) | 2003 අංක 04 දරන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ I කොටසේ 04 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ වයඹ පළාතේ රජයේ පෙර පාසැල් 131 ක් හා පෞද්ගලික පෙර පාසැල් 2,149 ක් වශයෙන් මුළු පෙර පාසැල් සංඛ්‍යාව 2,280 ක් පිහිටුවා තිබුණි. ඉන් රජයේ පෙර පාසැල් 15 ක් හා පෞද්ගලික අංශයේ පෙර පාසැල් 267 ක් ලෙස පෙර පාසැල් 282 ක් ඉහත ප්‍රඥප්තියේ 04(2) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. එහෙත් ඉකුත් වසරේ ලියාපදිංචි නොකරන ලද සමස්ථ පෙර පාසැල් 903 න් 759 කට සමාලෝචිත වර්ෂය තුළදී තාවකාලික ලියාපදිංචිය ලබාදී තිබුණි. | පෙරපාසල් ලියාපදිංචි කර අධිකාරියේ නියාමනයට නතු කළ යුතුය. | පූර්ව ළමා අධිකාර ප්‍රඥප්තියේ 4 (2) වගන්තිය යටතේ පෙරපාසලක් ලියාපදිංචි කිරිම සඳහා සපුරාගත යුතු අවම ප්‍රමිතීන් සම්පූර්ණ කර ගැනීමට පෙරපාසල් උපදේශිකාවන් පියවර නොගැනීම මෙම තත්ත්වයට මුලික හේතුව වී ඇත. තවද පළාත් පාලන ආයතන මඟින් ගාස්තු අයකරන පෙරපාසල් වල උපදේශිකාවන්ගේ වෘත්තීය සුදුසුකම්වල අඩුපාඩු පැවතීම වැනි කරුණු ද මෙයට හේතු වී ඇත. |

## (ආ) වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අධිකාරිය විසින් පවිත්‍රතා සේවා සහ ආරක්ෂක සේවා සැපයීමේ දී ගිවිසුම්ගත සේවක ප්‍රමාණය සැපයීමට අධිකාරියට නොහැකි වුවහොත් එම නොසපයන සේවකයෙකුගේ දිනක වැටුප දඩ මුදලක් ලෙස අයකරනු ලබන අතර 2019 වර්ෂය තුළ දී එලෙස දඩ මුදල් ලෙස අධිකාරිය විසින් ආයතනවලට ගෙවූ මුදල රු.6,031,342 ක් විය. ඒ අනුව අදාල සේවාව නිසි පරිදි සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | ගිවිසුම්ගත සේවක සංඛ්‍යාව සැපයීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. | ගිවිසුම්ගත සේවක ප්‍රමාණය සැපයීමට අවශ්‍ය පරිදි සේවක කළමනාකරණ ක්‍රියාවලීන් හඳුන්වාදී ඇත. නමුත් අපගේ පාලනයෙන් බැහැර වන හදිසි තත්වයන් වලදී සේවකයන්ගේ පැමිණීම අඩුවේ. එමෙන්ම යම් සේවකයෙකු නොදන්වා සේවයට වාර්තා නොකල හොත් එම සේවකයන්ගේ දෛනික වැටුප අධිකාරිය විසින් අධිහාර කරගනු ලබයි. |
| (ii) | ආයතනය විසින් බැංකු ගිණුම් 08 ක් පවත්වාගෙන යනු ලබන අතර, එම ගිණුම් අතර විධිමත් මුදල් කළමනාකරණයක් සිදු නොවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට එක් ගිණුමක රු.18,221,055 ක බැංකු අයිරාවක් පැවතුණි. ආයතනය සතු ශුද්ධ මුදල් ශේෂය රු.31,502,792 ක් වුවත්, අයිරා පොලිය හා බැංකු ගිණුම් වැඩි ප්‍රමාණයක් පවත්වාගෙන යාම මත බැංකු ගාස්තු ලෙස රු.1,355,909 ක මුදලක් ආයතනයට දැරීමට සිදු වී තිබුණි. | බැංකු ගිණුම් පවත්වාගෙන යාමේදී මූල්‍ය පිරිවැය අවම වන පරිදි මූල්‍ය කළමනාකරණය කළ යුතුය. | බැංකු අයිරාවක් පවතින්නේ ආරක්ෂක හා පවිත්‍රතා අංශයේ වැටුප් ගෙවීම සඳහා භාවිතා කරනු ලබන ගිණුමෙහිය. ආරක්ෂක හා පවිත්‍රතා අංශයේ වැටුප් ගෙවීම සඳහා මසකට රු.මි.30.5 ක් පමණ වැය වේ. සේවාව සපයන ආයතන වලින් නියමිත පරිදි මුදල් නොලැබෙන හෙයින් බැංකු අයිරාවක් නොගෙන වැටුප් ගෙවීම් සිදුකිරීම ප්‍රායෝගිකව කළ නොහැක්කක් වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | මානව සම්පත් සංවර්ධන අධිකාරිය විසින් ලබාදෙන චක්‍රීය ණය වලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයකර ගැනීම හිඟහිට ඇති වර්ෂ 04 කට වඩා වැඩි ණය වාරික හා පොලිය රු.12,194,029 ක් විය. | හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා විධිමත්ව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

**(ඇ) වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 දෙසැම්බර් 16 දිනැති අංක 303 දරන මාණ්ඩලික පත්‍රිකාව අනුව කාර්යාංශයේ එක් එක් කාර්ය පැවරුම් සඳහා ඉපයූ ලාභයෙන් සියයට 5 ක් සුභසාධන අරමුදලට අඩු කොට ඉතිරි ලාභයෙන් සියයට 55 ක් කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා වශයෙන් ගෙවනු ලබන අතර එලෙස 2019 වර්ෂය තුළ දිරිදීමනා වශයෙන් රු.4,813,222 ක් ගෙවා තිබුණි. ඊට අමතරව ඉතිරි සියයට 45 න් රු.1,292,126 ක් නිලධාරින් විසින් ඉතිරිකරගත් අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි. | දිරිදීමනා යෝජනා ක්‍රමය හා එහි නිර්ණායක සඳහා විධිමත් පරිදි අනුමැතිය ලබා ගත යුතුය. | දිරි දීමනා ගෙවීමේ මූලික අරමුණ වනුයේ කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගෙන යාම සඳහා ආදායම් උත්පාදන කටයුතු දිරිමත් කිරීම, ආයතනයේ සේවකයින් අභිප්‍රේරණය කිරීම, සුදුසුකම් සහිත තාක්ෂණික හැකියාවන් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයින් ආයතනය තුළ දිගුකාලීනව රඳවා ගැනීමයි. අභිප්‍රේරණයක් ලෙස ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා 1990 වසරේ කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගත් අනුමැතියට අනුව 1991 වසරේ සිට ගෙවීම් කරනු ලබයි. දිරි දීමනා ගෙවීම් කරනු ලබන්නේ හුදෙක් ව්‍යාපෘති පදනම් කරගෙන වන අතර, ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කරනු ලබන්නේ සේවයට පැමිණීම පදනම් කර ගෙනය. |

**(ඇ) වයඹ සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව වසර 02 ක කාලයක් ඉක්මවූ රු.1,593,492 ක් වූ රැඳවුම් තැන්පතු නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් 2020.01.28 වන දින පැවති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදීද සාකච්ඡා කල අතර, අදාල රැඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමින් පවතී. |
| (ii) | නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලසුම්කරණයක් නොමැතිව රු.12,618,363 ක වියදමක් දරා නිම කරන ලද මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය වසර 03 ක කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පැවතුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී මෙම මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා රු.178,628 ක් වැයකර තිබුණි. | මෙම සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය ඵලදායීව උපයෝජනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | මේ වන විට ගොඩනැගිල්ල ආයෝජකයෙකු සඳහා බදු දී ඇති අතර, එම බදුදීමට අදාල කටයුතු සිදුකරන තෙක් ස්ථානයට සපයා ඇති විදුලි හා ජල පහසුකම් සැපයීමට හා ගොඩනැගිල්ලේ ආරක්ෂාව වෙනුවෙන් මුරකරුවෙකු යෙදවීමට කටයුතු කළ බැවින් හා ස්ථානීය පරීක්ෂාවන් වෙනුවෙන් මෙම රුපියල් 178,304 ක වියදම දරා ඇත. |
| (iii) | බඩගමුව සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන අවන්හල ඇතුළු කඩ කාමර 13 කින් කඩ කාමර 12 ක ගිවිසුම් කාලය 2019 දෙසැම්බර් 31 දිනට අවසන් වී මාස 01 ත් මාස 07 අතර කාලයක් ගතවී ඇතත් එම කඩ කාමර නැවත බදුදීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර වලින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුයි. | මේ පිළිබඳව 2020.06.10 වන දින සාකච්ඡාවක් පැවැත් වූ අතර, දැනට ඉතිරි වී ඇති සියලුම කඩකාමර බදුදීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. |

**(ඉ) වයඹ සමූපකාර සංවර්ධන අරමුදල**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමූපකාර පනතට අදාල රීති සංග්‍රහයේ 43 (ii) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට සමූපකාර අරමුදල වෙත ලැබිය යුතු රු.54,828,713 ක හිඟ දායක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමූපකාර පනතේ රීති ප්‍රකාරව ලැබිය යුතු දායක මුදල් අයකර ගත යුතුයි. | සමිතිවල කාරක ප්‍රාග්ධන ගැටලු අවම කර ගනිමින් දායක මුදල් ගෙවීම් කරන අතර, වර්තමානයේ පවතින කොරෝනා වසංගත තත්වය යටතේද, සමූපකාර සමිති දැඩි මූල්‍ය අර්බුදයකට ලක්ව ඇත. 2020.04.30 දින වන විට හිඟ මුදලින් රු.36,127,047 ක් අය වී ඇත. |
| (ii) | වයඹ සමූපකාර සංවර්ධන අරමුදල විසින් සමූපකාර සමිති 37 ක් සඳහා ලබාදුන් ණය මුදල් රු.69,087,433 ක් නියමිත කාලසීමාව තුළ අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සමූපකාර සමිති සඳහා ලබාදී ඇති ණය මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | මාස 12ට අඩු කල් පසු ණය යාවත්කාලීනකර ගැනීමට හැකියාව ලැබී ඇති අතර මාස 12ට වැඩි කල් පසු ණය අයකර ගැනීම සඳහා සමූපකාර අරමුදල් කමිටුවේ උපදෙස් පරිදි ව්‍යවස්ථානුකූලව කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | සමූපකාර සමිති 14 කට ලබාදී තිබූ රු.33,194,700 ක් වූ ණය වෙනුවෙන් එකදු වාරිකයක් හෝ අයකරගෙන නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසු ණය මුදල් ලබාදීමටත්, නියමිත පරිදි ණය මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | මෙහි දක්වා ඇති සමිති බොහෝමයක් මූල්‍ය අර්බුදයට ලක්ව ඇත. මෙම සමිති සඳහා ණය ලබා දී ඇත්තේ පවතින මූල්‍ය අර්බුදයෙන් මුදවා ගැනීමට හා සේවක ප්‍රජාවගේ රැකියා සුරක්ෂිත කිරීමේ අරමුණින් වේ. මෙම සමිති වල මූල්‍ය දුෂ්කරතා අවම කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමුපකාර අරමුදලේ දක්වා ඇති කාර්යයන්ට පටහැනිව දෙපාර්තමේන්තු කාර්යාල උපකරණ සඳහා සහ දෙපාර්තමේන්තු ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.12,002,797 ක වියදමක් දරා තිබුණි. | සමුපකාර අරමුදලේ අපේක්ෂිත කාර්යයන් සඳහා පමණක් අරමුදල් යෙදවිය යුතුයි. | අරමුදලේ කටයුතු විධිමත් ලෙස කළමනාකරණය සඳහා අත්‍යාවශ්‍යව පැවති බැවින් කාර්යාල උපකරණ මිලට ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම සිදු කර ඇත. |

**(ඊ) වයඹ ජනකලා පදනම**

------------------------

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | නිර්දේශය<br>------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ |
|---|---|---|---|
| (i) | ජනකලා පදනම විසින් 2019 වර්ෂය තුළ වයඹ පළාතින් පිට සැපයුම්කරුවන්ගෙන් නැවත අලෙවි කිරීමේ පරමාර්ථයෙන් රු. 5,610,330 ක භාණ්ඩ මිලදී ගැනීම් සිදු කර තිබුණි. මේ හේතුවෙන් වයඹ පළාතේ පාරම්පරික කලා ශිල්ප ආරක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම හා දේශීය කර්මාන්ත නංවාලීම යන වයඹ ජනකලා පදනමේ ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් මුළු භාණ්ඩ තොගයේ වටිනාකමින් වයඹ පළාත තුළ සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබුණේ සියයට 34 ක වටිනාකමින් යුතු භාණ්ඩ පමණි. | පාරම්පරික කලා ශිල්ප ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා සාම්ප්‍රදායික නිර්මාණකරුවන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා වැඩි ප්‍රමුඛස්ථානයක් ලබා දිය යුතුය. | අලෙවිසැල් වෙත භාණ්ඩ සැපයීමේදී වඩාත් උසස් ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන ලබා දීම සිදු කළ යුතු බැවින් වයඹ පළාත තුළ නිෂ්පාදනය නොකරන, වැඩි පාරිභෝගික ආකර්ෂණයක් සහිත උසස් ප්‍රමිතියෙන් යුත් නිර්මාණ අනෙකුත් පළාත් වලින් මිලදී ගැනීමට සිදු වී ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2019 වර්ෂයේ උපමාන පාදක ප්‍රදාන යටතේ වයඹ පළාතේ පාරම්පරික ජනකලා ප්‍රවර්ධනය සඳහා පමණක් පදනම වෙත රුපියල් මිලියන 5 ක් වෙන්කර තිබුණි. ඒ හේතුවෙන් වයඹ ජනකලා පදනමේ ප්‍රඥප්තියේ 05 (අ) හා 05(ආ) වගන්තිවල සඳහන් කාර්යයන් කිසිවක් ඉටු නොකර නැටුම් කලාව හා ජන කලාවන් පැවැත්වීමට පමණක් උක්ත මුදලින් රු.4,833,839 ක් වැය කර තිබුණි. | ආයතනයේ අරමුණු හා ඉලක්කයන් ඉටු කර ගැනීමට අදාල සැලසුම් සකස් කිරීමේදී සමබර ලෙස එම අරමුණු හා ඉලක්කයන් ඉටු කර ගැනීමට හැකි පරිදි සැලසුම් සකස් කළ යුතුය. | වයඹ ජනකලා පදනමට භාණ්ඩ සපයනු ලබන සියලුම ලියාපදිංචි සැපයුම්කරුවන් සඳහා පුහුණු වැඩමුළුවක් මෙන්ම ඔවුන්ගේ ගැටලු හඳුනාගෙන ඔවුන්ගේ නිර්මාණ හා කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබා දීමේ වැඩසටහනක් සංවිධානය කර ඇති අතර මෙම වැඩසටහන් 2020 වර්ෂයට තුළ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව කාරුණිකව දන්වමි. |

## (උ) වයඹ ප්‍රධාන අමාත්‍ය අරමුදල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1990 අංක 02 දරන වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ප්‍රඥප්තියේ අංක 6 ජේදය ප්‍රකාරව අරමුදලේ මුදල් වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම සඳහා, අධ්‍යාපන ඥානය වර්ධනය කිරීම සඳහා, ආගම නංවාලීම සඳහා සහ ආගමික වත්පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා යෙදවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ දී ඒ සඳහා කිසිදු මුදලක් ප්‍රධාන අමාත්‍ය අරමුදලින් දරා නොතිබුණි. | ප්‍රඥප්තියේ කාර්යයන්ට ප්‍රමුඛතාවය දක්වමින් අරමුණු ඉටු කර ගැනීමට සම්පත් මෙහෙය විය යුතුය. | ප්‍රඥප්තිය අනුව ප්‍රධාන අමාත්‍ය අරමුදලේ අරමුණු විගණනයේ සඳහන් කර ඇති නිර්ණායකයන්ට තිබෙන බව සඳහන් කරමි. එසේ වුවද බරපතල ගණයේ සැත්කම් හා බෝනොවන රෝග සඳහා පිළියම් යෙදීමේදී මුදල් ඌණතාවයෙන් පෙළෙන ජනතාව සඳහා සහනයක් සැලසීමට ඇති එකම අරමුදල ප්‍රධාන අමාත්‍ය අරමුදල වේ. ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර අනිකුත් ඉල්ලීම් සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව සඳහන් කරමි. |

**(ඖ) වයඹ පරිසර අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් පරිසර අධිකාරිය මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරනු ලබන පාරිසරික නිරවුල් කිරීමේ සහතික නිකුත් කිරීම සහ පසු විපරම් කටයුතු අධීක්ෂණය කිරීමේ සේවා ගාස්තු වෙනුවෙන් ආයතන 63 ක් විසින් තැන්පත් කර ඇති රු.7,650,842 ක් වසර ගණනාවක් තිස්සේ නියමිත පරිදි පරීක්ෂණ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් නිරවුල් නොකළ ණයහිමි ශේෂ වශයෙන් පැවතුණි. | සේවාලාභී ආයතනවලින් ලබාගන්නා තැන්පතුවලට අදාල පරීක්ෂණ කටයුතු නිශ්චිත කාලසීමාව තුළ අවසන් කර ණයහිමි තැන්පතු ශේෂ නිරවුල් කළ යුතුය. | ගෙවිය යුතු තැන්පතු ශේෂ වශයෙන් දක්වා ඇත්තේ මහා පරිමාණ ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රමවේදය අනුව ව්‍යාපෘති ආරම්භයේ දී ව්‍යාපෘති යෝජක විසින් මෙම අධිකාරිය වෙත තැන්පත් කළ යුතු ස්ථාවර මුදලකි. මෙම මුදල මෙකී ව්‍යාපෘතීන් අනුමත කිරීමේ ක්‍රියාවලීන් සඳහා අධිකාරිය විසින් අවශ්‍ය අවස්ථා වලදී වැය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතීන් අනුමත කිරීමෙන් අනතුරුව පසුවිපරම් කටයුතු නිරන්තරයෙන් සිදු වන බැවින් මෙම තැන්පතු ණයහිමි ශේෂයන් පැවතීම බොහෝ විට සිදු වේ. |

**(එ) මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 1995 අංක 04 දරන වයඹ පළාත් මඟී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 17 (ආ) වගන්තිය අනුව මඟී ප්‍රවාහනය සඳහා අවසරපත් නිකුත් කිරීම, එම අවසරපත් අලුත් කිරීම හෝ අවලංගු කිරීම සහ ගාස්තු නියම කිරීම අධිකාරිය විසින් කළ යුතුය. එම ගාස්තු සහ නියෝග සකස් කර 2012 ඔක්තෝබර් 15 දින දක්වා අවස්ථා කිහිපයකදී ගැසට් කිරීම මඟින් | ගාස්තු සංශෝධනයන් ගැසට් පත්‍රයේ පලකර නීතිගත කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | නීතිගත කර ඇතත් ඉන් පසු අවස්ථා කිහිපයකදීම සිදුකරන ලද ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ පලකර නීතිගත කර නොතිබුණි. | | |
| (ii) | නව මගී ප්‍රවාහන අවසර පත්‍ර ලබාදීම සඳහා ටෙන්ඩර් අයදුම් කිරීමට අදාල උපදෙස් පත්‍රිකාවේ 15 කොන්දේසිය ප්‍රකාරව ටෙන්ඩර් ප්‍රදානය කිරීමෙන් පසු ටෙන්ඩර් අයදුම්පතේ සඳහන් ලංසු මුදලින් හරි අඩක් එදින අයදුම්කරු විසින් ගෙවිය යුතු අතර ඉතිරි අර්ධය දින 14 ක් ඇතුලත ගෙවා නිම කළ යුතුය. එහෙත් 2019 අගෝස්තු 05 සහ නොවැම්බර් 25 යන දිනවල විවෘත කරන ලද ටෙන්ඩර්වලදී අයදුම්කරුවන් 03 දෙනෙකුගෙන් රු.2,935,950 ක් අයවිය යුතුව තිබියදීත් මගී ප්‍රවාහන අවසර පත් නිකුත් කර තිබුණි. | සම්පූර්ණ ලංසු මුදල ගෙවා අවසන් අයදුම්කරුවන්ට පමණක් මගී ප්‍රවාහන අවසර පත්‍ර නිකුත් කළ යුතුය. | මෙම ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් බස් රථ ධාවනයේදී ඉතිරි ටෙන්ඩර් මුදල් ගෙවන බවට සභාපතිතුමා වෙත ඉල්ලීම් කර ඇති අතර එම ඉල්ලීම් ගරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩයේ අනුමැතියෙන් පසු මෙම මාර්ග බලපත්‍ර ලබා දී ඇත. |

## 4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

### පේෂකර්ම දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමුද්‍රව්‍ය සැපයීම ඇතුලත්ව පේෂකර්ම මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේ වාණිජ අත්තිකාරම් ගිණුමට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ඉන්වොයිස් ණයගැතියන් ඇතුළුව මුළු ණයගැති | දීර්ඝ කාලයක සිට අය නොවී පවතින ණය ශේෂ සම්බන්ධයෙන් පළාත් භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුයි. | 2009 ට පෙර වර්ෂවල ණය අය කර ගැනීමට මූලික තොරතුරු සඳහා පත් කර ඇති කමිටු වාර්තාවට අනුව සමහර වර්ෂවල ණය ශේෂ නිවැරදි විය යුතුය. 2009 ට පෙර වර්ෂවල හිඟ ණය ශේෂ පිළිබඳ වාර්තාවක් |

| | | |
|---|---|---|
| ශේෂය රු.28,495,880 ක් වූ අතර ඉන් වසර 05 – 21 අතර කාලයක් ගත වූ එකතු ණයගැති ශේෂය රු.3,596,302 ක් හා වසර 08 ක් ඉක්ම වූ එකතු ඉන්වොයිස් ණයගැති ශේෂය රු.6,726,643 ක් විය. මෙම හිඟහිටි ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | | ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර උපදෙස් ලබා ගැනීමට තීරණය කරන ලදී. දැනට හිඟ ණය ශේෂ වශයෙන් අතිරික්තව ලැබී ඇති මුදලින් පැරණි ණය මුදලේ කොටසක් හිලව් කිරීමට අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. |

## 4.3 අනෙකුත් අත්තිකාරම් ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන 40 ක ස්ථාන මාරු වී ගිය, මිය ගිය, සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ වෙනත් හේතු මත නිරවුල් නොවූ දීර්ඝ කාලයක සිට පැවත එන සේවක ණය ශේෂවල එකතුව රු.46,561,004 ක් විය. | 2014 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාන මාරු වී පැමිණි හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ මාස තුනක් ඇතුලත නිරවුල් කල යුතු බව පිළිගනිමි. එසේ වුවද යම් විශේෂ හේතු මත හා ඉතා දීර්ඝ කාලයක සිට පැවතුන යම් ණය ශේෂ අය කර ගැනීමට අදාල වන්නා වූ තොරතුරු නොමැති වීම නිසා යම් යම් ණය ශේෂයන් මෙතෙක් නිරවුල් කර ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමි. |
| (ආ) | පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන 14 කට ස්ථාන මාරු වී පැමිණි නිලධාරින් වෙනුවෙන් නිරවුල් කිරීමට තිබූ ණය ශේෂ එකතුව රු.31,746,425 ක් විය. | 2014 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව ණය ශේෂ නිරවුල් කිරීමට කටුයුතු කළ යුතුය. | ණය ශේෂ නිරවුල් කිරීම සඳහා ණය ශේෂයන් තහවුරු කර ගැනීමට ලිපි යොමු කර ඇත. ණය ශේෂ නොසැසඳීම නිරවුල් කිරීමේ දී ගැටළුවක්ව පවතින අතර එය නිවැරදි කර ගෙන ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

#### 5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ සඳහා අනුමත ප්‍රදාන හා ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 3,043.28 | 2,286.34 | 756.94 | 25 |
| (ආ) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 272.40 | 222.32 | 50.08 | 18 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 200.00 | 13.62 | 186.38 | 93 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 150.00 | 104.29 | 45.71 | 31 |
| | **එකතුව** | **3,665.68** | **2,626.57** | **1,039.11** | **28** |

#### 5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු. 2,970,410,000 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 1691 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| | විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද යෝජනා වැඩ ගණන | අතැති බිල් වැඩ ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් නිම කළ | 1353 | 22 | 484 | 1375 | 1,923,262,991 |
| (ආ) | 50% කට වඩා අඩුවෙන් නිමකළ | 38 | - | - | 38 | 226,977,705 |
| (ඇ) | 50% කට වඩා වැඩියෙන් නිම කළ | 86 | | - | 86 | 518,571,273 |
| (ඇ) | ආරම්භ කර නොතිබූ | 192 | - | - | 192 | 301,598,031 |
| | | **1669** | **22** | **484** | **1691** | **2,970,410,000** |

## 5.1.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික වකුගඩු රෝග නිවාරණ ඒකකයේ 2018 හා 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මූලය හඳුනානොගත් වකුගඩු රෝගය වයඹ පළාත තුළ ව්‍යාප්තවීමට හේතු සොයාබැලීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ රේඛීය අමාත්‍යාංශය මඟින් හෝ වයඹ පළාත ඉලක්ක කර ගනිමින් විධිමත් පර්යේෂණයක් සිදු නොකිරීම හේතුවෙන් රෝගය සෑදීමට හේතු නිශ්චිතව හඳුනාගැනීමට නොහැකිවී තිබුණි. | වයඹ පළාත තුළ වකුගඩු රෝග ව්‍යාප්තිය සඳහා වූ හේතු සොයා ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | මූලය හඳුනා නොගත් වකුගඩු රෝගය වයඹ පළාත තුළ ව්‍යාප්ත වීමට හේතු සොයා බැලීම ජාතික මට්ටමින් සිදු කරනු ලබයි. පළාත් මට්ටමින් සිදු කරන වැඩසටහන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු මඟින් සිදු කරනු ලබන නමුත්, මෙම හඳුනා නොගත් වකුගඩු රෝගය වයඹ පළාත තුළ ව්‍යාප්ත වීමට අදාල කරුණු සහ ඒවාට යෙදිය යුතු පිළියම් සම්බන්ධව නිරන්තරයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටු තුළ සාකච්ඡා කර නිසි බලධාරීන්ගේ අවධානයට යොමු කර ඇත. |
| (ආ) | පුත්තලම දිස්ත්‍රික්කයේ අවදානම් නොවන කලාපවල වකුගඩු රෝගීන් හඳුනාගැනීමේ සායන කටයුතු 2018 වර්ෂයේදී ආරම්භකර තිබූ අතර ප්‍රදේශ 04 ක සිදුකරන ලද සායන 06 කදී අවදානම් හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව 40 ක් හා 2019 මැයි 31 දින දක්වා ප්‍රදේශ 05 ක සිදුකරන ලද සායන 07 කදී අවදානම හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව 39 ක් වශයෙන් දක්නට ලැබුණි. | පුත්තලම් දිස්ත්‍රික්කය තුළ වකුගඩු රෝගීන් හඳුනාගැනීමේ සායන හා නිවාරණ කටයුතු වැඩිකිරීම කෙරෙහි කඩිනමින් අවධානය යොමුකළ යුතුය. | 2018 හා 2019 වර්ෂයන්හි ඉලක්කගතව පැවැත්විය යුතු සායන සංඛ්‍යාව හඳුනා ගන්නා ග්‍රාම නිලධාරී වසම් අනුව සියයට 80 ක් වී තිබූ අතර එම සියලු ප්‍රමාණය ආවරණය කර ඇත. තවද ඊට අමතරව ඉදිරිපත් වී ඇති ඉල්ලීම් සියල්ල ද ආවරණය කර ඇත. |
| (ඇ) | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික | සියලු අවධානම් කලාපවල | එක් එක් වර්ෂ වල ජනගහන සමීක්ෂණ |

වකුගඩු රෝග නිවාරණ ඒකකයේ 2018 හා 2019 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්මට අනුව සියලුම අවදානම් කලාපවල සිටින වයස අවුරුදු 20 ට වැඩි සියලුම පුද්ගලයන් වසර 03 කට වරක් පරීක්ෂාවට ලක්කල යුතු වුවද කුරුණෑගල දිස්ත්‍රික්කයේ අවදානම් කලාපවල 2016 වර්ෂයේ සිට 2019 මැයි 31 දින දක්වා කාලය තුළ සායනවලදී පරීක්ෂා කරන ලද රෝගීන් සංඛ්‍යාව ඉලක්කගත ජනගහනයට සාපේක්ෂව අවදානම් කලාප 08 ක 2016 වර්ෂයේ සියයට 03 සිට සියයට 34 දක්වා, 2017 වර්ෂයේ සියයට 0.1 සිට සියයට 20 දක්වා, 2018 වර්ෂයේ සියයට 02 සිට සියයට 07 දක්වා සහ 2019 වර්ෂයේ සියයට 0.5 සිට සියයට 06 දක්වා ඉතා අඩු ප්‍රතිශතයක් වීම නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරාගැනීමට නොහැකි වී තිබුණි.

වැඩි පිරිසක් පරීක්ෂාවට ලක්වන ආකාරයේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

වාර්තාවලට අනුවත්, පරීක්ෂා කරන ක්‍රමවේදය අනුවත්, මාර්ගෝපදේශය අනුවත් ඉලක්කගත ජනගහන සංඛ්‍යා ලේඛන වෙනස්වීම සිදු වේ.

2016 , 2017 වර්ෂ වල සායන සඳහා සහභාගි වී ඇති සංඛ්‍යාව වැඩි වීමට හේතුව වන්නේ ඇහැටුවැව හා පොල්පිතිගම යන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාශ පමණක් සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි විශේෂ ව්‍යාපෘතියක් ලෙස (Mega Clinic) සිදු කල නිසාවෙනි.

2018 , 2019 වර්ෂ සඳහා ඉදිරිපත් කර ඇති දත්තයන් සහ ප්‍රතිශතයන් සඳහන් කර ඇති පරිදි නොවන අතර ,එම වර්ෂ වල වකුගඩු රෝග වැඩසටහන මාර්ගෝපදේශය හා ක්‍රියාකාරි සැලැස්ම අනුව අඩු අවදානම් කලාපයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල සහ අවදානම් නොවන කලාප වල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල කිහිපයක පවතින රසායනාගාර පහසුකම් මත වෛද්‍ය සායන හා ආයතනික මට්ටමින් අවශ්‍ය පමණින් සිදු කරන ලදී.

| වර්ෂය | අවදානම් කලාපය | අවදානම් නොවන කලාපය | වෛද්‍ය සායන | වැඩබිම් | පරීක්ෂා කල ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 2018 | 16406 | 1366 | 1618 | - | 19390 |
| 2019 | 16231 | 2305 | 5670 | 13512 | 37718 |

(ඇ) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මඟින් අවදානම් කලාපවල ඇති සෑම පාසලකම ජල පරීක්ෂාවක් නිරන්තරවම සිදුකිරීමට මෙතෙක් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අවදානම් කලාප 11 ක් තුල පිහිටි පාසල් 347 කින් 2018 හා 2019 වර්ෂවල පරීක්ෂා කර තිබුණේ

අවදානම් කලාපවල සෑම පාසලකම ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය.

ජල සාම්පල් පරීක්ෂා කිරීම නොමිලයේ සිදු නොකිරීම මත මෙම තත්ත්වය ඇති වී ඇත. ජලය බීමට නුසුදුසු බව හඳුනා ගත්ත ද තාවකාලික විසඳුමක් ලෙස RO Plant ජනාධිපති කාර්යසාධන බලකාය යටතේ නාවික හමුදාව විසින් ස්ථාපිත කර ඇත. ස්ථිර විසඳුමක් ලෙස ජල සැපයීමේ ව්‍යාපෘති මේ සම්බන්ධයෙන් බාහිර ආයතන යටතේ ආරම්භ

| | | | |
|---|---|---|---|
| | පාසල් 187 ක පමණක් වූ අතර ඉන් පාසල් 169 කම ජලය බීමට නුසුදුසු බව හඳුනාගෙන තිබුණි. එසේම පොල්පිතිගම, ගිරිබාව හා මහව යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අයත් පාසල්වල ජල සාම්පල් පරීක්ෂා කිරීම ඉතා අවම මට්ටමක පැවතුණි. | | කර ඇත.<br>ජලයේ රසායන ද්‍රව්‍ය (බැර ලෝහ)පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් දැනට අවම මට්ටමේ පවතී. ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට බලාපොරොත්තු වේ. |
| (ඉ) | පළාත් ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පළාත් නිශ්චිත සංවර්ධන යෝජනාවක් යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක අවම පහසුකම් සහිත ග්‍රාමනිලධාරී වසම් 100 ක ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් ගම් 100 යි වැඩ 100 යි ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂය තුළ සලසා තිබුණු රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදනයෙන් ව්‍යාපෘති 157 ක් ක්‍රියාත්මක කර තිබුණි. මෙහිදී ප්‍රතිපාදනය රු.13,750,000 ක් වූ ව්‍යාපෘති 13 ක් අවිච්ඡේද වීම, ප්‍රතිපාදනය රු.103,459,283 ක් වූ ව්‍යාපෘති 115 ක කිසිදු මූල්‍ය ප්‍රගතියක් නොතිබීම හා ගිවිසුම් අවලංගු කිරීම හේතු කොටගෙන ප්‍රතිපාදනය රු.7,740,000 ක් වූ ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | ගිවිසුම්ගත සංවිධානවල සාධාරණ ඉල්ලීම් මත ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටලු මත ද ව්‍යාපෘති 13 ක් අවිච්ඡේද වීම සිදු වී ඇත. 2019 වර්ෂයේ පැවති උග්‍ර අක්මුදල් ඌනතාවය හේතුවෙන් රු.88,834,633 ක ප්‍රමාණයක් අතැති බිල්පත් වශයෙන් පවතින අතර වැඩ විෂයන්වල මූල්‍ය ප්‍රගතිය 0% වශයෙන් පෙන්වා ඇත. එකී අතැති බිල්පත් සියල්ල මේ වන විට ගෙවා අවසන් කර ඇත.<br>ව්‍යාපෘති 05 ක හැර අනෙක් සියලුම වැඩ විෂයයන් අයහපත් කාළගුණික තත්වය හේතුවෙන් ඉදි කිරීමට අපහසු විය. එසේම අවශ්‍යතාවය පැවතියද ඉඩම් අයිතිය නිශ්චිතව තහවුරු කර ගැනීමට නොහැකි වීම මත එක් ව්‍යාපෘතියක් සහ ගිවිසුම්ගත කාලය ප්‍රමාණවත් නොවීම මත තවත් ව්‍යාපෘතියක් අවලංගු කර ඇත. |

## 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුත්තලම දිස්ත්‍රික්කයේ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සෙම්බැට්ට අට්ටවිල්ලුවකැලේ ග්‍රාමයේ අක්කර 10 රූඩ් 01 පර්චස් 22 ක විශාල ඉඩම් කොටස් දීර්ඝ කාලීන බදු පදනමින් ලබාදීම සඳහා 2004 සැප්තැම්බර් 03 දිනැති ගැසට් පත්‍රයේ පල කර එවකට අමාත්‍යවරයා විසින් අනුමත කර තිබියදී අදාල ඉඩම නියමිත පුද්ගලයාට බදු දීමට කටයුතු නොකොට 2009 සැප්තැම්බර් 23 දිනැතිව බලපත්‍ර 05 ක් මඟින් වෙනත් පුද්ගලයින් වෙත පැවරීම කර තිබුණි. මෙහිදී 1982 වර්ෂයේ අදාල බලපත්‍ර මඟින් පැවරීම හේතුවෙන් රජයට ලැබිය යුතු බදු කුලී ආදායම අහිමි කර තිබුණි. | බදු කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ තැලසීමියා අරමුදලේ රු.1,549,333 ක තැන්පතු ශේෂයක් වසර 03 ක කාලයක සිට නිශ්කාර්යව පවතින අතර, ඉදිරි වර්ෂ 02 තුළදී එකී අරමුදල් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳ සැලසුමක් හෝ සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත රු.2,188,000 ක මුදලක් නිදහස් කර ඇත්තේ එම දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ ඉදිරිපත් කරන ලද සිව් අවුරුදු ක්‍රියාත්මක සැලැස්ම සඳහාය. එය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉතිරි මුදල සඳහා නව ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂව දැනුවත් කර ඇත. එම ව්‍යාපෘති වාර්තාව ලැබුණු පසු අදාල ප්‍රතිපාදන නිදහස් කර පළාතේ රෝගීන් සඳහා එම අරමුදල් භාවිතා කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පරිහරණය කරන හෙක්ටයාර් 32.4042 ක වපසරියකින් යුත් රෝහල් ඉඩම් 23 ක අයිතිය අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු බව හා ඉඩම් 31 ක අයිතිය වෙනත් රාජ්‍ය ආයතන සතු බව හා තවත් ඉඩම් 31 ක අයිතිය පෞද්ගලික අංශය සතු බව හඳුනාගෙන තිබුණි. තවත් ඉඩම් 23 ක හිමිකම් අයිතිය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම් විධිමත්ව හා කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | සෞඛ්‍ය ආයතන පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇති අතර ඒවායින් බොහෝමයක පවරා ගැනීමට අදාල කටයුතු සිදුවෙමින් පවතී. අදාල කටයුතු සිදු වීම ප්‍රමාද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නැවත ඉල්ලීම් කර ඇත. |
| (ඈ) | කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අවදානම් කලාප 08 න් රස්නායකපුර හා ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ස්ථාපිත කර නොතිබුණි. රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා රු.16,140,053 ක් වැයකර ඉදිකරන ලද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය 2018 අගෝස්තු 13 දින විවෘතකර ඇතත් 2019 ජූනි මාසය දක්වාම අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් ලබානොදීම හේතුවෙන් එය ක්‍රියාකාරී මට්ටමට පත්වී නොතිබුණි. එම තත්ත්වය මත රස්නායකපුර ප්‍රදේශයේ වකුගඩු රෝගීන් හඳුනාගැනීමේ හා නිවාරණ කටයුතු කොටවෙහෙර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් හා ඇහැටුවැව ප්‍රදේශයේ රෝගීන් හඳුනාගැනීමේ කටයුතු ගල්ගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් කිරීමට සිදුව තිබුණි. | රස්නායකපුර සහ ඇහැටුවැව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල කඩිනමින් පිහිටුවා වකුගඩු රෝගීන් හඳුනාගැනීමේ සායන ක්‍රියාත්මක කළ යුතුය. | රස්නායකපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සඳහා කාර්ය මණ්ඩලය යොදවා ක්‍රියාකාරි මට්ටමට පත් කර ඇත.<br>ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විශේෂ වැඩසටහනක් පැවැත් වූ අතර එය අවදානම් නොවන කලාපයක් ලෙස හඳුනාගෙන ඇත.එම විශේෂ සැලැස්මට අනුව 2020 වර්ෂයේ නැවත පරීක්ෂා කිරීමට යෝජිතව පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දඹදෙණිය මූලික රෝහලේ රුධිර කාන්දුකරන ඒකකය ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.15,597,878 ක ප්‍රතිපාදන හා රුධිර කාන්දුකරන ඒකකයට අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.28,396,400 ක ප්‍රතිපාදන ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම ඒකකයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | රුධිර කාන්දුකරණ ඒකකය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | මේ සඳහා අවශ්‍ය කරනු ලබන සෞඛ්‍ය කාර්ය මණ්ඩල අවශ්‍යතා ලබා නොදීම මත මෙම තත්ත්වය ඇති වී ඇත. |
| (ඊ) | පුත්තලම මූලික රෝහලේ රුධිර කාන්දුකරන ඒකකයේ ඉදිකිරීමේ කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් 2018 වර්ෂයේදී රු.14,013,709 ක හා 2019 වර්ෂයේදී රු.1,046,854 ක ප්‍රතිපාදන ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි. | පුත්තලම මූලික රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකයේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමා කිරීම හේතුවෙන් 2019 වර්ෂයේ දී සම්පූර්ණයෙන් ඉටු කර නැති අතර 2020 වර්ෂයේ ප්‍රතිපාදන ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත.මේ සඳහා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මිලදී ගැනීමට අපේක්ෂිතව තිබූ ජල පිරිපහදු කිරීමේ යන්ත්‍ර (RO hka;%) හා රුධිරකාන්දුකරණ යන්ත්‍ර (Dialysis hka;%) මිලදී ගෙන අප වෙත ලබා දී නොමැත. |
| (උ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබියදී ඖෂධ වර්ග 08 ක් ඖෂධ සංස්ථාවෙන් මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් රු.2,133,161 ක මුදලක් දෙපාර්තමේන්තුවට අතිරේකව දැරීමට සිදුවී තිබුණි. | දෙපාර්තමේන්තුව තුළ ඖෂධ නිෂ්පාදනය වැඩිකර සංස්ථාවෙන් මිලදී ගන්නා ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කළ යුතුය. | ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවන්හි වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය 100 % ම සම්පූර්ණ කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් අප දෙපාර්තමේන්තුවේ ඖෂධ නිෂ්පාදනාගාරය සතු නොවේ. ඒ අනුව වාර්ෂික අවශ්‍යතාවයෙන් යම් ප්‍රතිශතයක් අනිවාර්යයෙන් ඖෂධ සංස්ථාවෙන් මිලදී ගැනීමට සිදුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2004 දෙසැම්බර් 31 දින ආරම්භ කර ඇති කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂි ව්‍යවසායක සංවර්ධන චක්‍රීය ණය අරමුදල ආරම්භ කිරීම සඳහා 2019 ජනවාරි 19 දින වයඹ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් සකස්කල රීති මාලාවට වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අරමුදලක් පිහිටුවීමේදී විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. | 2004 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද චක්‍රීය ණය යෝජනා ක්‍රමය, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ බවට සඳහන් නෛතික ලියවිල්ලක් සොයාගැනීමට නොමැති අතර, චක්‍රීය ණය මුදලට අදාල රීති මාලාව සඳහා ඉදිරියේදී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (එ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ චක්‍රීය ණය අරමුදල් යෝජනා ක්‍රමය ආරම්භයේ සිට 2019 අගෝස්තු 03 දින දක්වා නිදහස් කල මුළු ප්‍රතිමූල්‍ය ණය මුදල රු.365,108,000 ක්වූ අතර, අයකළ ප්‍රතිමූල්‍ය ණය වාරික මුදල රු.249,946,859 ක් විය. එදිනට ප්‍රතිමූල්‍ය ණයගැති සහ මුදල් ශේෂය පිළිවෙලින් රු.115,161,141 ක් හා රු.8,141,614 ක්වූ අතර, මේ සඳහා 2004 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා චක්‍රීය ණය අරමුදල සම්බන්ධයෙන් අවසන් ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රීය ණය අරමුදල ප්‍රඥප්තියක් මඟින් පිහිටු විය යුතු අතර ප්‍රඥප්තියට අනුව අවසන් ගිණුම් පිළියෙල කිරීම සහ විගණනය සිදු කළ යුතුය. | 2004 වර්ෂයේ සිට චක්‍රීය ණය අරමුදල සම්බන්ධයෙන් අවසන් ගිණුම් පිළියෙල කර ඇති බවට තොරතුරු සොයාගත නොහැකි අතර, 2019 අගෝස්තු මස සිට මේ දක්වා සකස් කරන ලද අවසාන ගිණුම් පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. |
| (ඒ) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තරුණ කිරි ගොවි ගම්මාන ව්‍යාපෘතිය පශු වෛද්‍යවරුන්ගේ හා සත්ව සංවර්ධන උපදේශකවරුන්ගේ අදහස් විමසීමකින් තොරව හා ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර ආරම්භ කර තිබූ බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළහැකි ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට සැලසුම් කර තිබූ ප්‍රතිලාභීන් 400 න් ප්‍රතිලාභීන් 179 ක් සඳහා පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා රජයේ ප්‍රතිපාදන මුදල් රු.16,970,000 ක් වැය නොකර අනවශ්‍ය ලෙස රඳවා ගෙන තිබුණි. | | |
| (ඹ) | කුරුණෑගල නගර මධ්‍යයේ පිහිටි අක්කර 01 පර්චස් 4.3 ක් වූ ඉඩම දීර්ඝ කාලීන බදු පදනම යටතේ වසර 15 කට රෝයල් එඩියුකේෂනල් සර්විසස් පුද්ගලික සමාගමට ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් 2014 වසරේදී පළාත් ඉඩම් කොමසාරිස් වෙත දන්වා තිබුණි. පළාත් ඉඩම් කොමසාරිස් විසින් වී අලෙවි මණ්ඩලය සමඟ වූ පැරණි ගිවිසුම අවලංගු කර නව ගිවිසුමක් ඇති කර ගැනීමට ක්‍රියා නොකර තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවට අනුව 2014 සිට 2018 දෙසැම්බර් 31 දක්වා රු.32,000,000 ක් වූ වසර 05 ක හිඟ බදු මුදල් ගෙවීමට අදාල ආයතනයට යොමු කර ඇතත් මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනෙන් පැරණි බදු ගිවිසුම් අහෝසි වන බැවින් ඉඩම රජයට පවරා ගැනීම හා නිවැරදිව බදු දීම, හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රෝයල් එඩියුකේෂනල් පුද්ගලික සමාගම හා වී අලෙවි මණ්ඩලය සමඟ ඇති කරගෙන ඇති බදු ගිවිසුම 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන අතර එය නැවත දීර්ඝ නොකිරීමට කටයුතු කරන මෙන් 2019 නොවැම්බර් 19 දිනැති ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් විසින් වී අලෙවි මණ්ඩලය දැනුවත් කොට ඇත. එමෙන්ම 2014 වර්ෂයේ අදාල ඉඩම වෙනුවෙන් බදු සඳහා අනුමැතිය ලැබීමෙන් පසු තක්සේරු ලබාගෙන අදාල බදු ගණනය කර ඉහත සමාගම වෙත බදු මුදල් ගෙවන මෙන් දන්වා ඇති අතර උක්ත සමාගම සඳහා දීර්ඝ කාලීන බදු සකස් කිරීමට අදාල ලේඛන ඉදිරිපත් කිරීමේදී බැඳීමක් ඇති කරගෙන තිබූ බවද කාරුණිකව දන්වමි. |

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වයඹ පළාත් ප්‍රාදේශීය ඖෂධ ගබඩා දෙකක, මූලික රෝහල් 8 ක සහ ප්‍රාදේශීය රෝහල් 40 ක 2019 සැප්තැම්බර් 30 දිනට රු.1,389,828 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ තොගයක්ද, ප්‍රාදේශීය ඖෂධ ගබඩා දෙකක, මූලික රෝහල් 06 ක ප්‍රාදේශීය රෝහල් 33 ක හා එක් වෛද්‍ය නිලධාරී කාර්යාලයක රු.1,470,156 ක් වටිනා ගුණත්වයෙන් අසමත් ඖෂධ තොගයක්ද දක්නට ලැබුණි. | ඖෂධ කල් ඉකුත්වීම අවම වන ලෙස ඖෂධ තොග පාලන ක්‍රමවේද හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | කල් ඉකුත් වන සහ ගුණාත්මක බවින් අඩු ඖෂධ පිළිබඳ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මඟින් සැලැස්මක් සකස් කර, එම ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ලබා ගැනීමේ වැඩසටහනක් මඟින් කල් ඉකුත් වූ තොග අඩු කර ගැනීමට කටයුතු කරනු ලබයි. |
| (ආ) | ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිවීම, අනුමත කාර්යමණ්ඩලයට සාපේක්ෂව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 48 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම හා සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සඳහා ධූමායන යන්ත්‍ර 02 බැගින් ලබාදීමට ධූමායන යන්ත්‍ර 22 ක් තවදුරටත් අවශ්‍යවීම යන හේතු මත ඩෙංගු මර්දන කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් ලබාදිය යුතුය. | ප්‍රමුඛතාවය මත සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල මඟින් මානව සම්පත් හා අනෙකුත් සම්පත් උපයෝගී කර ගැනීම හා ධූමායන යන්ත්‍ර මැලේරියා අංශය මඟින් ලබාගෙන ඩෙංගු මර්දන කටයුතු කරනු ලබයි. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී අඹ ගම්මාන ස්ථාපිත කිරීම සහ අඹ පැල 25000 ක් මිලදීගැනීම වෙනුවෙන් රු.10,000,000 ක ප්‍රතිපාදනයක් ඇතිකර තිබුණි. මෙම මිලදීගැනීමට අදාල ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර, | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතුය. | 2019 වර්ෂයේ ආරම්භයේදී සකස් කරන ප්‍රසම්පාදන සැලැස්මට මෙම ව්‍යාපෘතිය ඇතුළත් කිරීමට නොහැකි වීම නිසා මෙම වැඩසටහන වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ 2019 ජූනි 12 දිනැතිව අනුමත කර එවන ලද සංවර්ධන |

| | | |
|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු පැල තවාන්වලින් රු.250 බැගින් මිලදීගැනීමට හැකියාව තිබියදී පෞද්ගලික සමාගමකින් රු.380 බැගින් පැල 25000 ක් මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා රු.3,250,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | | සැලැස්ම ඇතුළත් ලිපිය අනුව ක්‍රියාත්මක කිරීමට සිදුවූ අතර, ඒ වන විට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අවසන් කර තිබූ බව කාරුණිකව දන්වා සිටිමි. |

## 5.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 / 2019 වර්ෂවලදී එක් එක් විධායක ඉංජිනේරු කාර්යාල විසින් සංවර්ධනය කළ යුතු බවට හඳුනාගෙන පිළියෙල කරන ලද මාර්ග ප්‍රමුඛතා ලේඛනයේ නොමැති මාර්ග 13 ක සංවර්ධන කටයුතු “කඩිනමින් නිම කළ යුතු වීම” හේතුව ලෙස දක්වා ආණ්ඩුකාර අනුමැතිය මත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.259,116,132 ක ගිවිසුම්ගත වටිනාකමකට අනුරාධපුර ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙත ලබා දී තිබුණි. 2019 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලදී නිම කිරීමට ගිවිසුම්ගත වී තිබූ උක්ත මාර්ග වලින් අඩක් 2019 දෙසැම්බර් 31 වන විටද සියයට 50 කට අඩු භෞතික ප්‍රගතියක් පෙන්වා තිබූ අතර එක් මාර්ගයක පමණක් ප්‍රගතිය සියයට 100 ලෙස දක්වා තිබුණි. මූල්‍ය ප්‍රගතියද සියයට 26 සිට සියයට 79 දක්වා විය. | පවතින නීති,රීති හා චක්‍රලේඛ වලට අනුගත විය යුතුය. | මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය වෙත ටෙන්ඩර් ප්‍රදානය කිරීම, මෙම දෙපාර්තමේන්තුවේ තීරණයක් නොවන අතර, අප විසින් තීරණය කර තිබුණේ විවෘත තරඟකාරි ක්‍රමයට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටු කිරීමටය. නමුත් මෙම වර්ෂයේ අපගේ සීමාවන්ට පරිබාහිරව ගරු ආණ්ඩුකාරවර නියමය පරිදි එම ඉංජිනේරු කාර්යාංශය මඟින් මෙම කටයුතු ඉටුකිරීමට තීරණය කර ඇත. ඉදිරිපත් වූ බිල්පත් සඳහා කොන්ත්‍රාත් ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතියද අඩු වී ඇත. |

## 5.5 දෘශ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනයක සටහන් තබා සහතික කර නොතිබුණු අතර 2010 ජූලි සිට 2010 නොවැම්බර් දක්වා අවස්ථා 30 කදී එකතුව රු.5,075,309 ක මුදල් සම්බන්ධයෙන් වූ කුවිතාන්සිවල මුල් පිටපත ගෙවීම් කරන්නාට ලබාදීමට කටයුතු කර නොතිබුණි. තවද 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වසර 04 ක කාලය තුළ ලැබී තිබූ රු.2,411,457 ක මුදලක් සරප් විසින් බැංකුගත කර නොතිබුණු අතර අක්‍රීය කරන ලද ගිණුම් දෙකට අදාලව බැංකු සැසඳුම් සකස් කිරීමට සහ සරප් විසින් එක් රැස් කර ගන්නා ලද මුදල් බැංකුගත කිරීම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම සඳහා අවස්ථා කිහිපයකදී කමිටු කිහිපයක් පත්කර ඇතත්, එම සියලුම කමිටු විසින් එම කාර්ය ඉටුකිරීමට කටයුතු කර නොතිබුණු අතර වගකිව යුතු බලධාරීන් ද, ඒ පිළිබඳව විධිමත් අවධානයක් යොමු කර නොතිබුණි. තවද 2007 වර්ෂයේ සිට 2012 වර්ෂයේ මැයි මාසය දක්වා බැංකු සැසඳුම් සකස් නොකිරීම හේතුවෙන් අක්‍රීය කරන ලද මහජන බැංකුවේ පවත්වාගෙන ගිය පොදු හා ගුරු වැටුප් බැංකු ගිණුම් දෙක වෙනුවට 2012 ජූනි මාසයේදී ලංකා බැංකුවේ නව ගිණුම් දෙකක් ආරම්භකර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදු කොට බැංකු සැසඳුම් විධිමත් ලෙස පිළියෙල කිරීම හා මුදල් බැංකු ගත නොකිරීම සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෘෂිකර්ම, ධීවර, සත්ව නිෂ්පාදන සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනයක් 2014 දෙසැම්බර් 30 දින අනතුරට භාජනය වීමෙන් රු.3,960,000 ක් රක්ෂණ වන්දි ලෙස අයකර ගැනීමට හා ඉතිරි මුදල වූ රු.340,000 ක් රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර ඇතත් රක්ෂණ වන්දිය ලබා ගත් බවට හෝ ඉතිරි මුදල අයකර ගත් බවට සනාථ කිරීම් නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ PB-4121 දරණ කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් රියදුරුගෙන් අයකිරීමට නිර්දේශ කර ඇති මුදල රියදුරුගේ වැටුපෙන් අයකිරීමට පියවර ගතයුතු බව ප්‍රධාන ලේකම්ගේ 2019.02.21 දිනැති ලිපියෙන් දන්වා ඇත. මේ පිළිබඳ ඉදිරි කටයුතු සිදු වූ බවට මෙතෙක් ප්‍රධාන ලේකම් දැනුවත් කර නොමැති අතර, ඒ සම්බන්ධව විමසීම් සිදු කර ඉතා කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

## 5.6 ආර්ථීක නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 ඔක්තෝබර් 10 දින වයඹ පළාත් සභාව විසුරුවා හැරීම නිසා සභාපතිවරයාගේ පදිංචියට සුදුසු නිල නිවාස පළාත් සභාව සතුව තිබියදී සභාපතිවරයාගේ නිල නිවස සඳහා 2019 ජනවාරි මාසයේදී රු.180,000 ක් වැය කර වාර්ෂික බදු පදනම මත පෞද්ගලික නිවසක් ලබාගෙන තිබුණි. | පළාත් සභාව සතුව වෙනත් නිල නිවාස ඇති බැවින් එම නිල නිවාසයක් සභාපතිවරයාට ලබාදීමට කටයුතු කළ යුතු අතර නිවාසය පරිහරණය කරන බවටද තහවුරු කරගත යුතුවේ. | පළාත් සභා කාර්යාලය සතුව නිල නිවාස නොමැත. පළාත් සභා අමාත්‍යාංශ සතුව පවතින නිල නිවාසයක් ලබා ගැනීම සඳහා එවක සිටි සභා ලේකම්තුමිය විසින් ප්‍රධාන ලේකම් වෙතින් විමසීම් කළ නමුදු (වාචිකව) ඒ සඳහා අනුමැතියක් ලැබී නොමැත. ඒ අනුව ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත මෙම නිවස ලබාගෙන ඇති බව දන්වමි. |
| (ආ) | ගල්ගමුව මූලික රෝහලට අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 15 ක් පමණ වැය කර මහ ගල්ගමුව ජලාශයේ සිට ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණද, ජලය සැපයීමට ස්ථාපිත කළ ජල | ළිඳෙහි ජලය රෝහල් අවශ්‍යතාවය සඳහා යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ගල්ගමුව මූලික රෝහල සඳහා ළිඳක් ඉදිකරන ලද්දේ අනෙකුත් කාර්යයන්ට ජලය ලබා ගැනීම සඳහා වන අතර පානීය ජල අවශ්‍යතා සඳහා නොවන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | පොම්ප 02 ක්‍රියාත්මක කිරීමට තරම් විදුලි පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වසර 03 ක් ගතවී ඇතත් රෝහලට ජලය සපයා ගැනීමට නොහැකි වී තිබුණි. තවද නිසි සැලසුමකින් හා ජල නියැදි පරීක්ෂා කිරීමකින් තොරව රු.2,253,856 ක් වැයකර ඉදිකල ළිදෙහි ජලය මඩ සහිත හා අධික ලවණ සහිතවීම හේතුවෙන් බීමට නුසුදුසු බව නිරීක්ෂණය කර තිබුණි. | | |
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ තොඩුවාව ධීවර තොටුපල 02 ක රු.297,507 ක රජයේ දායකත්ව මුදල් යටතේ ඉදිකර තිබූ අව් ආවරණ 03 ක් ගලවා ඉවත් කර තිබුණි. තවද ධීවර යාත්‍රා හා නවීන තාක්ෂණික උපකරණ ලබාදීම යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සඳහා තෙප්පම් 146 ක් සියයට 50 ප්‍රතිලාභී දායකත්වය යටතේ ලබාදී තිබූ අතර, නියැදි පරීක්ෂාව අනුව තෙප්පම් 15 කින් 09 ක් නියමිත ප්‍රමිතියට අනුකූලව සකස් කර නොමැති බැවින් ඒ සඳහා දැරූ රු.250,730 ක වියදම ඇතුළු රු.548,237 ක් අනාර්ථික වියදම් බවට පත්ව තිබුණි. | අව් ආවරණ ප්‍රයෝජනයට ගත යුතුය. තෙප්පම් නියමිත ප්‍රමිතියට සකස් කරගත යුතුය. | අධික මෝසම් සුළං ඇති වීම සහ ගල් වැටි ඇතිරීමට නොහැකි වීම නිසා ඇති වූ මුහුදු ඛාදනය හේතුවෙන් තහඩු වල ආරක්ෂාවට එම අව් ආවරණ ගලවා තබා ඇත. තෙප්පම් 09 න් තෙප්පම් 05 ක් දෝෂ සහිත තත්ත්ව මතු වූ බවට අමාත්‍යාංශ ක්ෂේත්‍ර භාර නිලධාරීන්ගේ පසු විපරම් වලදී වාර්තා වී ඇත. ඉතිරි තෙප්පම් 04 පිළිබඳ පසු විපරම් කළ ද, මේ වන තෙක් ඒ පිළිබඳ වාර්තා කර නොමැති බැවින් සොයා බලා අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව දන්වා සිටිමි. |

## 5.7 වත්කම් කළමනාකරණය

### 5.7.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය තුලදී රු.3,408,168 ක වියදම් දරා මිලදීගෙන තිබුණු ආසෘත ජලය නිපදවීමේ යන්ත්‍ර (Distil Water Operator machine) 07 න් දඹදෙණිය, නිකවැරටිය හා ගල්ගමුව රෝහල් වෙත ලබාදුන් යන්ත්‍ර 03 ක් වසර 1 ½ ක් තුල අක්‍රිය තත්වයට පත්වී තිබුණි. | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | Distil Water Operator යන්ත්‍ර මඟින් ජලය පිරිපහදු කිරීම වියදම් අධික බැවින් මේ වන විට එම යන්ත්‍ර මිළදී ගැනීම සිදු නොකරන අතර මූලික රෝහල් ඇතුළුව දිස්ත්‍රික්කයේ සියලුම රෝහල් වල ආසෘත ජලය අවශ්‍යතාවය අනුව මිලදී ගෙන ලබාදීම සිදු කරන බව දන්වා සිටිමි. |

### 5.7.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාරියපොල සහ ගල්ගමුව ගොවිපොලවල්වල ගාල් කර තිබුණු වාහන 07 ක් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් එක් වාහනයක් 2008 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගෙන ගතයුතු අතර නැතිනම් අපහරණය කළ යුතුය. | **73 ශ්‍රී 2758 වාහනය**<br>වාරියපොල කෘෂිකර්ම විද්‍යාලය වෙත ලබා දීම සඳහා කටයුතු කර ඇත.<br>**109 ශ්‍රී 475 හා K-120 වාහනය**<br>අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත.<br>**41-2014 වාහනය**<br>නිකවැරටිය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය වෙත ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී.<br>**73-2757, 72-3233, 27-3878 වාහන,**<br>අපහරණ කටයුතු සඳහා යොමු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | **<u>KS – 8730 දරන ජීප් රථය</u>**<br>හිටපු ගරු අමාත්‍යතුමා වෙත වෙන් කළ වාහනයකි. වයඹ පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර ඇත. |
| (ආ) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 24 ක්, පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය සතු වාහන 11 ක්, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 11 ක් සහ වයඹ ප්‍රධාන අමාත්‍යාංශය සතු වාහන 09 ක් ලෙස වාහන 55 ක් එම ආයතන නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආයතන සතුව පවතින වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම වාහන විවිධ අමාත්‍යාංශ යටතේ පවතින බැවින් එකින් එක පරීක්ෂා කර බලා පවරා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | පළාත් පාලන ආයතනවල ප්‍රධාන විධායකය සඳහා වෙන් කර තිබුණු වාහන වෙනුවෙන් ඉන්ධන සීමාවන් වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණු අතර පළාත් පාලන ආයතන විසින් ද ඉන්ධන සීමා පනවා නොතිබුණි. මේ හේතුවෙන් කිසිදු සීමාවකින් තොරව ඉන්ධන ලබා ගන්නා අවස්ථා මෙන්ම සභා තීරණ මත ප්‍රවාහන දීමනා ලබා ගන්නා අවස්ථා ද පැවතුණි. | ඉන්ධන සීමා පැනවීමට හා අධීක්ෂණයට කටයුතු කළ යුතු වේ. | විගණනය විසින් පෙන්වා දී ඇති ගරු නගරාධිපතිවරුන්ට/ ගරු සභාපතිවරුන්ට ලබාදෙන ඉන්ධන සීමාවන් සම්බන්ධ ගැටලුව මාගේ අංක ව/පපාදෙ/01/11/02/34 දරන සහ 2020 ජනවාරි 13 දිනැති ලිපිය මඟින් පළාත් පාලන ආයතන වලින් ලබාගත් තොරතුරු අනුව ද නිරීක්ෂණයට ලක් වී ඇත. |

## 5.8 කාර්ය මණ්ඩල පරිපාලනය

### 5.8.1 පළාත් සභා (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර) ආයතනවල කාර්ය මණ්ඩල පිළිබඳ නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාර්ග නඩත්තු හා මාර්ග සංවර්ධනයේදී, ක්ෂේත්‍රයේ අධීක්ෂණ කටයුතු සිදුකරන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, කාර්මික නිලධාරී තනතුරු 19 ක පුරප්පාඩු පුරවා නොතිබූ නිසා වසර තුළ මාර්ග සංවර්ධනය හා නඩත්තුවල සාර්ථකත්වය කෙරෙහි මෙම තත්ත්වය දැඩි ලෙස බලපා තිබුණි. | පුරප්පාඩු ඇති වූ විට නොපමාව පිරවීමට කටයුතු කළ යුතුය. | මෙම පුරප්පාඩු පිරවීම සඳහා අදාළ බලධාරීන් වෙත නිරන්තරයෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ තනතුරු 63 ක්, කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ තනතුරු 68 ක්, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ තනතුරු 30 ක්, සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ තනතුරු 10 ක්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තනතුරු 11 ක්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තනතුරු 05 ක් සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තනතුරු 04 ක් වශයෙන් තනතුරු 191 ක සේවක පුරප්පාඩු පැවතුණි. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | මූල්‍ය ප්‍රතිපාදන, භෞතික සම්පත් සේවා අවශ්‍යතාවය යන කරුණු සැලකිල්ලට ගෙන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටුයුතු කරන බැවින් මෙම ඌනතා පවතී. ඇතැම් තනතුරු වල ඇති පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ කර ඇති අතර, ඇතැම් තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවල ලේකම් තනතුරු කළමනාකරණ සහකාර (අධිශ්‍රේණියේ) තනතුරක් වුවද, වයඹ පළාතේ ප්‍රාදේශීය සභා 29 කින් 10 ක් | ප්‍රාදේශීය සභාවල ලේකම් තනතුරු සඳහා සුදුස්සන් පත්කිරීමට කටයුතු කළ යුතුවේ. | නගර සභාවක හා ප්‍රාදේශීය සභාවක ලේකම් වශයෙන්, පැවරී ඇති වගකීම් ප්‍රශස්ථ ලෙස ඉටුකල හැකි පළාත් පාලන |

සඳහා සංවර්ධන නිලධාරීන් ද සභා 02 ක් සඳහා කළමනාකරණ සහකාරවරුන්ද තවත් එක් සභාවක් සඳහා විශ්‍රාමික කළමනාකරණ සහකාර (අධි) නිලධාරියෙකුද දීර්ඝ කාලයක වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. එයින් ඇතැම් පත්වීම් වයඹ පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී තිබූ අතර සමහර පත්වීම් පළාත් පාලන කොමසාරිස් විසින් ලබාදී තිබුණි. මෙම පත්වීම් වලට අදාලව වැඩ බැලීමේ දීමනා ලබා ගැනීමේ හිමිකමක් මෙම නිලධාරීන්ට නොමැති වුවද ඇතැම් නිලධාරීන් වැඩ බැලීමේ දීමනා ලබාගැනීමට කටයුතු කර තිබුණි.

ක්ෂේත්‍රය සම්බන්ධ නිසි අවබෝධයක් හා අත්දැකීම් සහිත නිලධාරීන් පුරප්පාඩුව පැවති ලේකම් තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. ස්ථිර නිලධාරීන් පත්කරන තෙක් රාජකාරි ආවරණය කිරීමට වෙනත් නිලධාරීන් පත්කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර වැඩපිළිවෙලක් වේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2019 පෙබරවාරි 13 දිනැති ලිපි මඟින් සංවර්ධන නිලධාරීන් 08 දෙනෙකු ප්‍රාදේශීය සභා 08 ක ලේකම් තනතුරු වල වැඩ බැලීම සඳහා පත්කරන ලද අතර 2020 මාර්තු 12 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කරන ලද නිලධාරීන් 07 දෙනෙක් පළාත් පාලන ආයතනවල ලේකම් තනතුරු සඳහා ස්ථාන ගත කරන ලදී. ඉන් 05 දෙනෙක් සේවයට වාර්තා කර ඇත. වනාතවිල්ලුව සහ ගිරිබාව ප්‍රාදේශීය සභා වෙත ස්ථානගත කරන ලද නිලධාරීන් දෙදෙනා අදාළ තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. මේ හේතුවෙන් මෙම තනතුරු දීර්ඝ කාලීනව පුරප්පාඩු වී ඇත.

## 5.8.2 අධ්‍යාපන කාර්යය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වයඹ පළාත තුළ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 918 ක්, විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව 71 ක්, ගුරු උපදේශක පුරප්පාඩු 71 ක් විෂය අධ්‍යක්ෂ පුරප්පාඩු සංඛ්‍යාව 7 ක් සහ පාසැල්වල අනධ්‍යාන කාර්ය මණ්ඩල පුරප්පාඩු 122 ක් පැවතුණි. | අධ්‍යයන හා අනධ්‍යාන කාර්ය මණ්ඩල පුරප්පාඩු කලාප මට්ටමින් හා පාසල් මට්ටමින් හඳුනාගෙන සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | 2018 දෙසැම්බර් 31 දිනට අ.පො.ස. (සා.පෙළ) විෂයයන්ට අදාලව වයඹ පළාත තුළ පවතින ගුරු පුරප්පාඩු සඳහා 2019 වර්ෂය තුළ පහත සඳහන් පරිදි ගුරුවරුන් බඳවා ගෙන ඇත.<br>දිස්ත්‍රික් මට්ටමෙන් උපාධිධාරින් 1713 ක්ද,<br>විද්‍යාපීය පත්වීම් 238 ක්ද,<br>අධ්‍යාපන වේදී උපාධිධාරීන් 22 ක්ද,<br>වශයෙන් ගුරු සේවයේ පුරප්පාඩු සඳහා මේ වන විට ගුරුභවතුන් 1973 ක ප්‍රමාණයක් බඳවාගෙන ඇත. |

## 5.8.3 සෞඛ්‍ය කාර්යය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 11 කට අයත් තනතුරු 17 ක සේවා කාලය වර්ෂ 05 ඉක්මවූ නිලධාරීන් 689 ක් ස්ථාන මාරුවීම් නොලබා එකම රෝහලේ සේවය කරමින් තිබුණි. | විධිමත් ස්ථාන මාරුවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුයි. | වෛද්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ. එමෙන්ම හෙද නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග ලබා දුන්නද හෙද නිලධාරීන්ගේ සංගමය මඟින් ඊට විරෝධය දැක්වීම හේතුවෙන් එම ස්ථාන මාරු ක්‍රියාත්මක වීම ප්‍රමාද වේ. අනෙකුත් තනතුරු සඳහා ද ස්ථාන මාරු නියෝග ලබා දුන්නද ඒ ඒ ආයතන වල සේවා අවශ්‍යතාවය අනුව පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොවන හෙයින් එදිනෙදා කටයුතු අඩාල වීම හේතුවෙන් මුදා හැරීම් කටයුතු ප්‍රමාද වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ අවදානම් කලාප 05 ක පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල වකුගඩු රෝග නිවාරණ කටයුතු වෙනුවෙන් වෙනම වෛද්‍යවරයෙකු අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සිටින වෛද්‍යවරුන්ට දෛනික රාජකාරී ඉටුකිරීමත් සමඟ වකුගඩු රෝග සායන පැවැත්වීම සාර්ථකව සිදුකිරීමට නොහැකිවී තිබුණි. 2018 වර්ෂය තුළ අවදානම් කලාප 05 ක පවත්වා තිබූ සායන සංඛ්‍යාව 50 ක් වූ අතර හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව 187 ක් වී තිබුණි. | අවදානම් කලාපවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට වකුගඩු කටයුතු වෙනුවෙන් වෙනම වෛද්‍යවරයෙකු යෙදීමට කටයුතු කිරීම සුදුසුය. | වෛද්‍යවරුන් පත් කිරීම හා මාරු කිරීම කරනු ලබන්නේ රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මඟිනි. වකුගඩු රෝග නිවාරණ කටයුතු වෙනුවෙන් වෙනම වෛද්‍යවරයකු අවශ්‍ය බව කිහිප වතාවක්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්-මහජන සෞඛ්‍ය සේවා වෙතද දන්වා තිබේ. |
| (ඇ) | පුත්තලම දිස්ත්‍රික්කයේ වකුගඩු රෝග නිවාරණ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා, දිස්ත්‍රික් වකුගඩු රෝග නිවාරණ ඒකකය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැතිවීම හා වකුගඩු රෝගී විශේෂඥ වෛද්‍යවරයෙකු (වෘක්කවේදී) පුත්තලම දිස්ත්‍රික්කය සඳහා අනුයුක්ත කර නොමැතිවීම බාධාවක්ව පැවතුණි. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | සෞඛ්‍ය සේවා කටයුතු සඳහා කාර්ය මණ්ඩලය යෙදවීමේ දී නිරන්තරයෙන් නිලධාරීන් හිඟය ගැටලුවක්ව ඇත. නමුත් පවත්නා කාර්යය මණ්ඩලය කළමනාකරණය කිරීම තුළින් ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවන් ලබා දීමට නිරන්තරයෙන් කටයුතු කර ඇත. |
| (ඈ) | කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල අවදානම් කලාපවල පිහිටි මූලික හා අනිකුත් රෝහල්වල රසායනාගාරවල වකුගඩු රෝග නිවාරණයට අදාල පරීක්ෂාවන් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම හා රුධිර කාන්දුකරන ඒකක කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති අවස්ථා දක්නට ලැබුණි. | රුධිර කාන්දුකරණ ක්‍රියාත්මක රෝහල්වලට ඒ සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ලබාදීමට කටයුතු කල යුතුය. | පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවල රසායනාගාර කාර්යය මණ්ඩලවල පැවති පුරප්පාඩු 2019 වර්ෂය වන විට සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. ඊට අමතරව පළාත් රසායනාගාරයක් පිහිටුවා එමඟින් අවශ්‍ය පරීක්ෂණ කටයුතු කිරීමෙන් පැවති මානව සම්පත් ගැටලු නිරාකරණය කර ගැනීමට හැකි වී තිබේ. |

## 5.9 ප්‍රසම්පාදනය

### වැඩ සැපයීම් හා සේවා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන කාර්ය පටිපාටි සංග්‍රහයේ 2.9.1 විධිවිධානයක් සමඟ පරිශීලනය කිරීම සඳහා නිකුත් කළ 2012 ජුලි 23 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක අංක 25 ට අදාලව, ප්‍රසම්පාදන කටයුතුවල රැස්වීම් සඳහා ගෙවීමකට හිමිකම ලැබීමට සාකච්ඡාවකට භාජනය වන කරුණු ගැන එකඟත්වයකට එළඹීමට අවම වශයෙන් දෙවතාවක්වත් සාමාජිකයින් රැස්වීම අනිවාර්ය වේ. තවද එබඳු රැස්වීම් සාමාන්‍ය වැඩ කරන වේලාවෙන් පරිබාහිරව පැවැත්විය යුතු වුවද වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව සාමාන්‍ය වැඩකරන වේලාව තුළ රැස්වීමක් පමණක් පවත්වා නිලධාරීන් 10 කුට එකතුව රු.1,102,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව ඔබ සමඟ සාකච්ඡා කර තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව පසුව පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි. |
| (ආ) | 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහාවූ අතිරේක අංක 28 ප්‍රකාරව ඉතා හදිසි වූ සහ ඉතා විශේෂ වූ කරුණු හේතුවෙන් නියමිත ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරවීම අවශ්‍ය වන විට මෙහි සඳහන් සීමාවන්ට යටත්ව ඒ සඳහා බලයදීමට නිසි අධිකාරියට හැකිය. එවැනි අවස්ථාවලදී ඊට හේතු | නියමිත ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරවීමට අවශ්‍ය වන විට ඊට හේතු පැහැදිලිව ලිඛිතව වාර්තා කළයුතු අතර, එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. | ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය අමාත්‍යාංශයට අනුබද්ධිත රාජ්‍ය ආයතනයක් වීම, ප්‍රවාහනය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු නොවීම, නිෂ්පාදනය කරනු ලබන සෑම ධීවර යාත්‍රාවක් සඳහාම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නාවික |

| | | |
|---|---|---|
| පැහැදිලිව ලිඛිතව වාර්තා කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එසේ කටයුතු නොකර රු.6,442,625 ක් වැයකර ධීවර උපකරණ ප්‍රාදේශීය සම්පත් අධිකාරියෙන් පමණක් මිල කැඳවීම් කර ලබාගෙන තිබුණි. | | ඉංජිනේරු සහකාර විසින් ගුණාත්මක බව පිළිබඳ අවශ්‍යතා සපුරා ඇති බවට ලබාදෙන සහතිකය ලබාදීම යන කරුණු පදනම් කරගනිමින් ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියෙන් පමණක් මිල ගණන් ලබාගෙන එම ආයතනය වෙතින් ධීවර උපකරණ ලබාගන්නා ලදී. |

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකයක් ස්ථාපිත කර තිබුණ ද පළාත් සභාවේ සියලු ආයතන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් මීන් අපේක්ෂිත අරමුණ නිසි පරිදි ඉටු වී නොතිබුණි. | පළාත් සභවේ සියලු ආයතන අභ්‍යන්තර විගණනයට ලක්විය යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

### 6.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය යටතේ අනුමත අත්තිකාරම් ගිණුම් කටයුත්තක් ලෙස විස්කම් නිවස පවත්වාගෙන යෑම සඳහා 1993 වර්ෂයේ ලබා දී තිබුණු රු.7,038,211 ක අත්තිකාරම් මුදල නිරවුල් නොවූ වැය ශේෂ ලෙස සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | රු.7,038,211 ක් වූ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට හෝ භාණ්ඩාගාර ගිණුම්වල දැක්වෙන මෙම ශේෂ පොතෙන් අත්හැර දැමීමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන ලේකම් විසින් පත් කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මඟින් පරීක්ෂා කර සකස් කරන ලද වාර්තාවක් ඉදිරිපත් කර ඇත. |